<u>කාර්ය පත්‍රිකාව</u>

**තේමාව** **:-** ජලය

**විෂය** **:-** පෙරදිග සංගීතය

**පන්තිය** **:-** 6 ශ්‍රේණිය

**පාඩම** **:-** ඇතිල්ලීමෙන්,පෙළීමෙන්,පිඹීමෙන් හඬ නිපදවිය හැකි භාණ්ඩ

(නිපුණතාව 7.0 - සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි)

**අරමුණු** **:-** පරිසරයෙන් සපයාගතහැකි ද්‍රව්‍ය යොදාගනිමින් ආදේශ භාණ්ඩ නිර්මාණය කරයි.

**පෙර ඉගෙනුම්** **:-** සිසුන් හට එක සමාන බීම බෝතල් කිහිපයක් සපයාගෙන ඒවා පිඹීමට පුරුදු පුහුණුවන ලෙස උපදෙස් ලබා දීම.

**පන්ති කාමර ඉගෙනුම** **:-**

- **සිසුන් කණ්ඩායම් 7කට බෙදා ශුද්ධ ස්වර සංකේතවල (ස රි ග ම ප ධ නි)යන නම්වලින් කණ්ඩායම් නම් කිරීම.**

- **ගුරුවරයාගේ උපදෙස් මත එක් එක් කණ්ඩායමට බීම බෝතලයක් ලබා දී සර්පිනාවක් (හාර්මෝනියම්) ආධාරයෙන් තම කණ්ඩායමට හිමි ස්වරයට ජලය පුරවමින් සුසිර කිරීමට යොමු කිරීම.**

- **ස්වර හතට ම අදාල බෝතල් සුසිර කරගත් පසු එක් එක් කණ්ඩායම්වල හොඳින්ම වාදනය කළ හැකි සිසුන් තෝරා රිද්මයානුකූලව ස්වර හත වාදනයට යොමුකිරීම හා ස්වර ස්ථාපන ගී, කෙටි සංගීත නිර්මාණ වාදනය කිරීම.**

- **(ස/ග/ප) යන ස්වර තුනට හිමි කණ්ඩායම් එකවර රිද්මයානුකූලව වාදනය කරවන්න. ඒ ආකාරයෙන්ම (ප/නි/රි ) හා (ම/ධ/ස) ලෙස එකවර රිද්මයානුකූලව වාදනය කරවන්න. එම වාදනයේ මිහිරිතාව සිසුන්ට රසවිඳීමට සලස්වන්න.**

- **බෝතල් හතම සිරස්ව පිළිවෙළට තබා එකිනෙක ගැටගසා ආදේශ සංගීත භාණ්ඩයක් නිර්මාණය කරන්න.**

**පසු ඉගෙනුම** **:-**

- **YouTube වෙබ් අඩවියට ගොස් Make and Play a Glass Bottle PanFlute ලෙස සටහන් කර වීඩියෝ පරීක්ෂාකර බලා එම වීඩියෝ නරඹන්න.**
- **මෙම සබැඳියාව ඔස්සේ ගොස් https://youtu.be/zEumX2qBGUc මෙම ආදේශ භාණ්ඩය නිර්මාණය කරන ආකාරය නරඹන්න.**
- **ඔබේ නිවසේදී ජලය යොදාගනිමින් නිර්මාණය කරන මෙම ආදේශ භාණ්ඩය හා මෙවැනි ආදේශ භාණ්ඩ සෑදීමට උත්සහ කරන්න.**